සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර කලාව

පෙබරවාරි 01 සතිය

ශ්‍රේණිය - 10 (I වාරය)




සැකසුම - කේ.කේ.කේ.පොල්වත්ත (නක්කාවිට ක.වි)
දැරණියගල කොට්ඨාසය

**පාඩම/ඒකකය - 1.1.2. මානව හා සත්ත්ව රූප ඇතුළත් පරිසරය පුළුල්ව අධ්‍යයනය කර චිත්‍ර සංරචනය කරයි**

## නිදහසේ සැරිසරන වන සතුන්

1. ඉගෙනුම් ආධාරක

- නිදහසේ සැරිසරන වන සතුන් දැක්වෙන චිත්‍ර සහිත ඡායාරූප

2. ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස්

- දී ඇති සිතුවම් හොඳින් නිරීක්ෂණය කරන්න.
- සතුන්ගේ විවිධ ක්‍රියාකාරකම් හා විවිධ වෙනස්කම්
- තැන තැන දක්නට ලැබෙන ස්වභාවික වෘක්ෂලතා

3. චිත්‍රයක් ඇඳීමේ දී සැලකිය යුතු පොදු උපදෙස් අධ්‍යයනය කරන්න.

- මාතෘකාවට අදාලව ඇඳිය යුතු ය
- තලය භාවිතය - ජීවී අජීවී වස්තූන් කඩදාසියේ සමබරතාවය රැකෙන පරිදි යෙදිය යුතු ය
- පර්යාලෝකය - ළඟ ඇති වස්තූන් විශාලවත් දුර වස්තූන් කුඩාවටත් පෙන්විය යුතු ය
- වර්ණ ගැන්වීමේ දී ත්‍රිමාණ ලක්ෂණ මතුවන සේ එළිය සහ අඳුර දැක්විය යුතු ය

4. ඇගයීම

- ආදර්ශ චිත්‍ර හොඳින් නිරීක්ෂණය කර ඔබ දැක ඇති වනාන්තරයක් මනසින් සිහිපත් කරන්න.
- දැන් ඔබ මනසින් දකින චිත්‍රය සිතුවමට නැඟීම සඳහා දළ සටහනක් ඇඳගන්න.
- දළ සටහනේ අඩුපාඩු ද නිවැරදි කරගනිමින් චිත්‍ර අඳින පොතේ ඇඳ වර්ණ කරන්න.